**තලාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 16 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 13 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 ව්‍යාචනය කළ මතය
-----------------------

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

1.3. ව්‍යාචනය කළ මතය සඳහා පදනම
--------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2015 අප්‍රේල් මස 20 වෙනි දින සභා අරමුදලින් මිලදී ගන්නා ලද රු.744,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍රය අපහරණය කර ඇති නමුත්, ගිණුම් වලින් එය ඉවත් කර නොතිබුණි. | ගිණුම් වලින් ඉවත් කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු රු.3,939,900 ක් වූ ආදායම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | අදාල ආදායම ගිණුම්වල දැක්විය යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අදාළ දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය සඳහා පොලී වියදම රු.212,049 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පොලි වියදම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ජංගම ගිණුම් 3 ක හඳුනා නොගත් තැන්පත් රු.2,927,860 ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තැන්පත් හඳුනා ගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (v) | 2019 වර්ෂයේ ජනවාරි මස ඉටු කිරීමට නියමිතව තිබුණු කාර්යයක් වෙනුවෙන් | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස ලැබී තිබුණු රු.50,000 ක මෝටර් ග්‍රේඩරයේ කුලී ලැබීම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (vi) | ගිණුම්කරණ මූලධර්ම වලට පටහැනිව රු.310,312 ක් වූ ආදායම් විෂයයන් 02ක් රු.174,066 ක් වූ වියදම් විෂයයකට හිලව් කර වෙනස රු.136,246 ක වටිනාකම වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ආදායම් සහ වියදම් පැහැදිලි ලෙස හෙළිදරව් කිරීමට පියවර ගතයුතු අතර එවැනි හිලව් කිරීම් නොකළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (vii) | උතුරු නැගෙනහිර පළාත් නගා සිටුවීමේ ව්‍යාපෘතිය (NELSIP) මගින් ඉදිකරන ලද තලාව පොදු වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ මුළු වටිනාකම රු.31,620,454 ක් විය යුතු වුවත්, එම ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.19,250,868 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | අදාල වත්කම් වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (viii) | සමාලෝචිත වර්ෂයේ සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි යටතේ සංවර්ධනය කරන ලද රු.1,979,927 ක සංවර්ධන ව්‍යාපෘති 02ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල වත්කම් ප්‍රාග්ධනිත කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ix) | වටිනාකම හඳුනා නොගත් සහල් කොටන යන්ත්‍රයක් ,තණකොළ කපන යන්ත්‍ර 02ක් සහ කිරිහලක උපකරණ කට්ටලයක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වත්කම් නිවැරදිව සමීක්ෂණය කර වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරිම සඳහා පියවර ගත යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (x) | 2018 වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. | සියළු වියදම් උපචිත පදනම අනුව ගිණුම්ගත කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (xi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ අතිරික්තය රු.8,889,725 ක් වුවද,වර්ෂයේ නිවැරදි අතිරික්තය රු.10,516,418 ක් වීම නිසා රු.1,626,693 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් මගින් නිවැරදිව වර්ෂයේ මූල්‍ය තත්වය, මූල්‍ය ප්‍රතිඵලය නිරූපනය විය යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ආ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,103,934 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය පිළිබඳව සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැලපිම් කර නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කර නිවැරදිව ගිණුම් පිළියෙළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ඇ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමේ හිඟ හිටි කුලී වටිනාකම් ශේෂ 4 ක එකතුව වූ රු.2,136,970 ක් මූල්‍ය ප්‍රකාශන වල රු.934,795 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,201,175 ක වෙනසක් පැවතුණි. | අදාල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුළු වත්කම් රු.266,359,881 ක් වූ නමුත්, මුළු හිමිකම් හා වගකීම් රු.273,227,354 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.6,867,473 වෙනසක් පැවතුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරිම් කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (iii). | ගිණුම් විෂයයන් 05 කට අදාලව ගිණුම්වල ශේෂ හා ලේඛන /උපලේඛනවල ශේෂ අතර රු.7,731,919 ක වෙනසක් විය. විස්තර පහත දැක්වේ. | අදාල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ඈ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට පැවත එන රු.36,026 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 17 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.234,274,798 ක්වූ ගිණුම් විෂයයන් 17 කට අදාලව හිමිකම් සහතික, වත්කම් වාර්තා, සමීක්ෂණ මණ්ඩල වාර්තා, තොග ලේඛන සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය . | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ අයකර ගන්නා ලද එකතුව රු.423,779 ක්වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනාරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත | මුද්දර බදු රු.206,995 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ඇ) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 50(1) වගන්තිය | අනුරාධපුරය ප්‍රධාන මාර්ගයේ රක්ෂිත සීමාව ඉක්මවා සභාව විසින් ඉදිකර තිබුණු කඩ කාමරය අනුරාධපුර විධායක ඉංජිනේරු කාර්යාලය විසින් ඉවත් කරන ලෙස දන්වා ඇතත් ඉවත් කර | පනතට අනුව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2045 දරන 2011 නොවැම්බර් 10 දිනැති ගැසට් නිවේදනය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාවට අයත් මාර්ගවල බොරළු ප්‍රවාහනය කිරිම වෙනුවෙන් ගාස්තු අය කිරිම සිදුකර නොතිබුණි. | ගැසට් නිවේදනය අනුව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,224,306 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,371,569 ක් විය.

2.2 මූල්‍ය පාලනය

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සංශෝධිත මුදල් පොත් අනුව රු.11,336,844 ක්වූ ශේෂය දැක්වීම වෙනුවට රු.8,540,034 ක්වූ සංශෝධනයට පෙර මුදල් පොත් ශේෂයයන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී එම ආකෘතිවල නිවැරදි තොරතුරු ඇති බවට සනාථ කරගත යුතු අතර අපරීක්ෂාකාරී තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,186,113 | 6,343,113 | 6,181,033 | 15,515,764 | 2,080,444 | 6,119,636 | 4,981,307 | 15,503,033 |
| (ii) | උසාවි දඩ | 6,930,000 | 5,700,000 | 9,500,000 | 12,611,712 | 7,801,067 | 6,500,000 | 6,000,000 | 10,378,207 |
| (iii) | මුද්දර ගාස්තු | | 3,000,000 | - | 6,664,130 | - | 2,000,000 | - | 3,502,840 |
| (iv) | බලපත්‍ර ගාස්තු | 2,678,000 | 401,000 | 392,595 | _ | 518,350 | 472,500 | 604,090 | - |
| | ව්‍යාපාර බදු | | 3,414,000 | 4,763,510 | _ | 4,789,774 | 3,200,000 | 5,242,174 | - |
| | කුලී | 18,456,253 | 2,838,640 | 1,522,395 | 308,740 | 1,204,560 | 1,182,640 | 1,381,035 | 583,280 |
| | ටෙන්ඩර් | 4,213,613 | 4,213,613 | 2,931,637 | 443,828 | 4,138,100 | 4,138,100 | 2,012,029 | 483,118 |
| | **එකතුව** | **45,463,979** | **25,910,366** | 25,291,170 | **35,544,173** | **20,532,295** | **23,612,876** | 20,220,635 | 30,450,478 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිග ආදායම සහ වර්ෂයේ බිල්කල ආදායමෙන් වර්ෂයේ දී 45% වූ රු.25,291,170ක් පමණක් අයකරගෙන තිබුණි. | පනතට අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

### 2.3.3 බදු කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ කුලී වටිනාකම රු. 2,836,640 ක් වූ මුදලින් 34% වූ රු. 958,685 ක් පමණක් අයකර ගෙන තිබුණි. | කුලී ආදායම් අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ ටෙන්ඩර් ආදායම රු.4,213,613 ක් වූ මුදලින් 66% වූ රු.2,791,199 ක් පමණක් අයකර ගෙන තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව සම්පූර්ණ වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුය. ගිවිසුම් කඩකරන්නන්ට එරෙහිව ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාර කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 12,611,712 ක් හා මුද්දර ගාස්තු රු.12,426,660 ක් විය. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය, පහසුව හා සුභසාධනය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

#### (ආ). ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙළ කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

#### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු | අරමුණු ,ඉලක්ක පිහිටුවා ලඟා කර ගැනිමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟ වරිපනම් හිමියන් කාර්යාලය වෙත පැමිණ සිදුකරන ලද ගෙවීම් පදනම් කොටගෙන දිරිදීමනා වශයෙන් රු.101,097 ක් නිලධාරීන් 15 දෙනෙක් අතර ගෙවීම් කර තිබුණි. | කාර්යාලය වෙත පැමිණ කරන ගෙවීම් සඳහා දිරිදීමනා ගෙවිය නොහැකි වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ආ) | සභාව විසින් භාවිතා කරමින් තිබුණු රු.39,686,310 ක් පිරිවැය වූ වාහන 5 ක් ලියාපදිංචි කර නොතිබුණි. | අදාල වාහන ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ඇ) | 2018 ජනවාරි මස සිට ජූලි මස දක්වා කාල සීමාව තුල උප පත්‍රිකා පොත් 20 ක් අස්ථානගත වී තිබුණි. | අස්ථානගත වූ ලදුපත් පොත් සම්බන්ධව මු.රෙ.103 හා 104 වගන්ති ප්‍රකාර කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ඈ) | 2018 පෙබරවාරි 06 දින සිට ජූලි 30 දින දක්වා කාලපරිච්ඡේදයේ පොදු ගිණුමට අදාලව ආදායම් විෂයන් වෙතින් නිතුක් කරන ලද ලදුපත් 37 කින් ලැබී තිබුණු රු 222,276.ක් බැංකුගත කර නොතිබුණි. | මු.රෙ.103,104 වගන්ති ප්‍රකාර කටයුතු කර ආයතන සංග්‍රහයේ විධිවිධාන වගකිව යුතු පාර්ශව සම්බන්ධව කඩිනමින් ක්‍රියාකල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ඉ) | 2018 මාර්තු 07දින සිට මාර්තු 30 දින දක්වා කාලපරිච්ඡේදයේ කුවිතාන්සි 10කින් යන්ත්‍ර සේවයේ යෙදවීම වෙනුවෙන් සභාවට ලැබී තිබුණු රු.83,200 ක් බැංකුගත කර නොතිබුණි. | මු.රෙ.103,104වගන්ති ප්‍රකාර කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ඊ) | සභාවට අයත් අංක LL 6932දරන ටිපර් රථය 2018 අප්‍රේල් 26 දින අනතුරකට භාජනය වී සිදුවී තිබුණු අලාභ හානි 2018දෙසැම්බර් 31දින වන විටද හානි වූ කොටස් අළුත්වැඩියා කර නොතිබුණි. | ප්‍රාරම්භක හා මූලික විමර්ශන පවත්වා හානි අයකර ගැනීමත් අළුත්වැඩියා කිරීමටත් කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

| | | | |
|---|---|---|---|
| (උ) | තලාව නගරයේ පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු නිමකර 2017මාර්තු මස සභාවට භාරදී ඇතත් 2018,දෙසැම්බර් 31දින වන විටද බදුදීමක් හෝ කුලියට දිමට කටයුතු කර නොතිබුණි. | පොදු වෙළඳ සංකීර්ණය බදුදීම් හෝ කුලියට ලබාදිම් මගින් ආදායම් ඉපයීම සඳහා, කඩිනමින් කටයුතු කල යුතු වේ | පිළිතුරු ඉදිරිපත් කර නැත |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු. 814,000 ක් වු සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ යන්ත්‍ර සූත්‍ර කට්ටලයක් ලිඛිත ගිවිසුමක් සහ සභා අනුමැතියක් රහිතව තෙවන පාර්ශවයක් වෙත 2013 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලබා දී තිබුණු අතර ඒ පිළිබඳ පසු විපරම් කර එමගින් ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි . | අදාල වත්කම් හඳුනාගෙන ලිඛිතව ගිවිසුමක් සහිතව ලබා දීමටත් අදාල වත්කම් වෙනුවෙන් ආදායම් අයකිරිමටත් පියවර ගත යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |
| (ආ) | ග්‍රාමීය ප්‍රදේශවල කි.මි.100 ක් සංවර්ධනය කිරීමේ 2017වැඩ සටහන යටතේ රු. 29,206,846 ක ව්‍යාපෘති 03 ක් සම්බන්ධව ඇස්තමේන්තු සැකසීමේදී සභාව අකාර්යක්ෂමව කටයුතු කර තිබීම නිසා ඇස්තමේන්තු අනුමත කර නොතිබුණි .එමෙන්ම මෙම ව්‍යාපෘති සඳහා ලංසු කැඳවීම් දැන්වීම් පල කිරීම සඳහා වැයකර තිබුණු රු.156,915 ක මුදල ඵලරහිත වී තිබුණි. | දැන්වීම් පලකිරිමේ මූල්‍ය අලාභය වගකිවයුතු පාර්ශව වෙතින් අයකර ගැනීම සඳහා කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

3.4 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.15,982,671 ක්වු ස්ථාවර වත්කම් ඒකක 12 ක් නිෂ්කාර්යවී තිබුණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන , හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මු.රෙ.771 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

| | | |
|---|---|---|
| (ආ) සහල් කොටන යන්ත්‍රයක් සහ කිරිහලක උපකරණ භාවිතයට නොගෙන සහා භූමිය තුළ මලකෑමට ලක්වී නිශ්කාර්යව දමා තිබුණි. | අදාල වත්කම් සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර වත්කම් භාවිතයට අවශ්‍ය කටයුතු සිදුකල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) මුදල් අමාත්‍යංශ කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2018 වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |